# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/24 - 2013 පෙබරවාරි මස 20 වැනි බදාදා - 2013.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් රජයට ගැනීම් පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 61 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4/3/4/2012/ඩී/70
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : ප්‍රාලේ/දො/ඉඅත්/පොදු/04

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 20 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.


1A - G 17303 — 355 (2013/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| I<br>*අත්කර ගැනීමේ නිලධාරී* | II<br>*ඉඩමේ විස්තරය* |
|---|---|
| ප්‍රාදේශීය ලේකම්,<br>දොළුව | මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර පහල කෝරළය සුළු කොට්ඨාසයේ, කවුඩුපිටිය ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක Maha/DOL/2012/616 හා 2013.02.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර A ලෙස දැක්වෙන රත්කිඳ වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්. 1.2287ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම් : |

*උතුරට* : ඩී. එම්. විජේසිරි හිමිකම් කියන පල්ලේවත්ත, පී. ජී. විමලරත්න හිමිකම් කියන පල්ලේවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය,
*නැගෙනහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය, හිමිකම් කියන්නා නොදන්නා රත්කිඳ වත්ත සහ පාර,
*දකුණට* : පාර සහ හිමිකම් කියන්නා නොදන්නා රත්කිඳ වත්ත,
*බටහිරට* : වයි. වී. ජිනදාස හිමිකම් කියන රත්කිඳ වත්ත

03-407

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.